**වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**තේ පර්යේෂණ මණ්ඩලය**

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# පුරප්පාඩු

තලවාකැලේ පිහිටි ශාන්ත කුම්බිස් වතුයායේ සහ රත්නපුර පිහිටි ශාන්ත ජෝකිම් වතුයායේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශාන්ත කුම්බිස් වත්ත, තලවාකැලේ

- පරිපාලන නිලධාරි (01)
- ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි (01)
- කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි (01)
- රියදුරු (02)

ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර

- කනිෂ්ඨ සහකාර ලිපිකරු (01)
- කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි (02)
- කර්මාන්තශාලා කාර්මික (01)

## 01. පරිපාලන නිලධාරි

**රැකියා විස්තරය**

වතුයාය කළමනාකරණය කිරීමේදී අදාළ තොරතුරු සැපයීම, ගිණුම් කටයුතු, ඇස්තමේන්තු පවත්වාගෙන යාම සහ වතුඅධිකාරීවරයාගේ උපදෙස් මත අවශ්‍ය කටයුතුවලට සහභාගී වීම සහ වතුඅධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ ඇස්තමේන්තු, ප්‍රගති වාර්තා සහ ගිණුම් නියමිත වේලාවට ඉදිරිපත් කිරීම ඇතුළු වතු කාර්යාල කටයුතු සියල්ලන්ටම වගකිව යුතු වේ.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා.පෙළ) විභාගය ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය (වතු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයට මෙය අදාළ නොවේ) **සමඟ** ප්‍රධාන ලිපිකරු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද **හෝ** ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරුවෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප :** වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව :** අවුරුදු 32 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 02. කනිෂ්ඨ සහකාර ලිපිකරු

**රැකියා විස්තරය**

ප්‍රධාන ලිපිකරු / ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරුගේ අධීක්ෂණය යටතේ කොට්ඨාශ (Divisional) කටයුතුවලට අදාළ කරුණු ඇතුළු කොට්ඨාශ පිරික්සුම් (Divisional), පොත්පත් සහ ලේඛන හැසිරවීම සහ ගණනය කිරීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා.පෙළ) විභාගය ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය (වතු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයට මෙය අදාළ නොවේ) **සමඟ** පුහුණු චෙක්රෝල් ලිපිකරුවෙක් ලෙස පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප :** වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 03. ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි

**රැකියා විස්තරය**

කර්මාන්තශාලා නිලධාරියාගේ (Factory Officer) / වතුඅධිකාරීවරයාගේ මගපෙන්වීම යටතේ තේ සැකසීමේදී කර්මාන්තශාලා නිලධාරියාට සහය වීම සහ අදාළ පොත්පත්, ලේඛන වාර්තා ආදිය පවත්වාගෙන යාමේ සියලු කටයුතු සිදු කිරීම හා මෙහෙයවීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා.පෙළ) විභාගය ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය (වතු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයට මෙය අදාළ නොවේ) **සමඟ** සහකාර කර්මාන්තශාලා නිලධාරියෙකු ලෙස වසර 05ක පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප :** වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව :** අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 04. කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි

**රැකියා විස්තරය**

කර්මාන්තශාලා නිලධාරියාගේ / ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරියාගේ අධීක්ෂණය යටතේ තේ සැකසීමේදී කර්මාන්තශාලා නිලධාරියාට සහය වීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා.පෙළ) විභාගය ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය (වතු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයට මෙය අදාළ නොවේ) **සමඟ** පුහුණු කර්මාන්තශාලා අධීක්ෂක ලෙස පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප :** වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 05. රියදුරු

**රැකියා විස්තරය**

වාහනය භාරව කටයුතු කිරීම සහ අමු දළු වර්ග සහ රෝගීන් ප්‍රවාහනය කිරීම, වාහනයේ ඇතිවන සුළු අලුත්වැඩියාවන් සහ දිනපතා නඩත්තු කිරීම සහ දිනපතා වාර්තා (Daily records) සහ චාරිකා චිට් (Trip Chit) තබා ගැනීම යනාදී කටයුතු වතුඅධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

08 ශ්‍රේණිය සමත් විය යුතු අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රය (බර වාහන පැදවීමට) ලබාගෙන තිබිය යුතු අතර, බර වාහන රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් අත්‍යාවශ්‍යවේ.

**වැටුප :** වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 06. කර්මාන්තශාලා කාර්මිකයා

**රැකියා විස්තරය**

කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණවල සියලුම සුළු අලුත්වැඩියාවන් සිදු කළ යුතු අතර, වතුඅධිකාරීවරයාගේ / කර්මාන්තශාලා නිලධාරියාගේ මගපෙන්වීම යටතේ සියලුම කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණවල වාර්තා නිසි පරිදි පවත්වාගෙන යා යුතුය.

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

08 ශ්‍රේණිය සමත් විය යුතු අතර, කාර්මිකයෙකු ලෙස අදාළ ක්ෂේත්‍රයේ වසර 04ක පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප :** වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

**වෙනත් ප්‍රතිලාභ**

- තෝරාගත් අපේක්ෂකයින්ට තේ පර්යේෂණ ආයතනයේ වතුයායන් විසින් නියම කර ඇති පරිදි තනතුරට අදාළ අමතර පහසුකම් සපයනු ලැබේ.

මෙම තනතුරු ස්ථිරයි. තෝරාගත් අපේක්ෂකයින් සේවා අවශ්‍යතා අනුව තලවාකැලේ ශාන්ත කුම්බිස් වත්ත / රත්නපුර ශාන්ත ජෝකිම් වත්ත හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන වෙනත් වතුයායන්වල සේවය කිරීමට සිදුවේ.

**සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් හෝ අයදුම්පත්‍රයක් සමග උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම්වල ඡායා පිටපත්, සේවා සහතිකවල ඡායා පිටපත් සහ අයදුම්කරුගේ කුසලතා තක්සේරු කළ හැකි අදාළ ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සමග 2024 දෙසැම්බර් 09 වැනි දින හෝ ඊට ප්‍රථම යටින් අත්සන් කර ඇති අය වෙත ලඟා වීමට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම අත්‍යාවශ්‍යවේ. තවද, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කිරීම අත්‍යාවශ්‍යවේ.**

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් යොමු කරන අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා යොමු කළ යුතු වේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවීම අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

කරුණාකර වැඩි විස්තර සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන **www.tri.lk** වෙත පිවිසෙන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කුම්බිස්,**
**තලවාකැලේ.**